

# ගිණුම්කරණය

## 12 ශ්‍රේණිය

## නිපුණතා මට්ටම - 4.3

## සුළු වියදම් හා බැඳි ගනුදෙනු සටහන් කිරීමට සුළු ගෙවීම් ජර්නලය පවත්වා ගනියි.



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

## සුළු මුදල් ගෙවීම් ජර්නලය

ව්‍යාපාරයක සිදුවන ගෙවීම්වලින් සමහර ගෙවීම්, අඩු වටිනාකම්වලින් යුක්ත වූ නිතර නිතර කරන ගෙවීම් ය.

නිදසුන් :-

පිරිසිදු කිරීමේ වියදම් රු. 150 ක් ගෙවීම
තැපැල් ගාස්තු වියදම් රු. 50 ක් ගෙවීම
ගමන් වියදම් රු. 100 ක් ගෙවීම

මේ අනුව තැපැල් ගාස්තු , පිරිසිදු කිරීමේ වියදම්, ගමන් වියදම් , සංග්‍රහ වියදම් , ලිපිද්‍රව්‍ය වියදම් ආදී වියදම් එදිනෙදා ගෙවන අඩු වටිනාකම්වලින් යුක්ත සුළු ගෙවීම් සඳහා නිදසුන් වේ.

ව්‍යාපාරයක නිතර නිතර සිදුවන, සුළු වටිනාකම් සහිත මුදල් ගෙවීම් පිළිබඳ ගනුදෙනු සටහන් කරනු ලබන මූලික සටහන් පොත **සුළු මුදල් ගෙවීම් ජර්නලය** ලෙස හැඳින්වේ.

එහි වගකීම ප්‍රධාන මුදල් භාරකරු යටතේ පත් කරනු ලබන සුළු මුදල් භාරකරුවෙකු වෙත පවරනු ලබයි. සෑම සුළු මුදල් ගෙවීමක් සඳහා ම මූලාශ්‍ර ලේඛනයක් ලෙස වවුචරයක් පිළියෙළ කළ යුතු අතර, එය **සුළු මුදල් ගෙවීම් වවුචරය** ලෙස හැඳින්වේ.

### සුළු මුදල් අග්‍රිමය

පාලනයකින් යුතුව සුළු මුදල් ගෙවීම් පවත්වාගෙන යාම සඳහා ප්‍රධාන මුදල් භාරකරු යටතේ පත්කරන සුළු මුදල් භාරකරුට යම් නිශ්චිත මුදලක් ලබා දෙන අතර එම මුදල **සුළු මුදල් අග්‍රිමය** ලෙස හැඳින්වේ.

එම සුලු මුදල් අග්‍රිමය භාවිතයෙන් සුළු ගෙවීම් කිරීම සහ සුළු මුදල් ගෙවීම් ජර්නලය පවත්වාගැනීම සුළු මුදල් භාරකරුගේ වගකීම වේ.

### සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම

අග්‍රිමය අවසාන වීමට ආසන්න වූ විට සුළු මුදල් භාරකරු ප්‍රධාන මුදල් භාරකරුගෙන් නැවත මුදල් ඉල්ලා සිටිය යුතු ය. එවිට ඒ දක්වා ගෙවා ඇති මුදලට සමාන මුදලක් නැවත සුළු මුදල් භාරකරුට ලබා දී අග්‍රිමය සම්පූර්ණ කරයි. එසේ කිරීම සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම ලෙස හැඳින්වේ.

නිදසුන් :- ලිහිනිගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රීමය රු. 2 00 කි. ලැබුණු සුළු මුදල් අග්‍රිමයෙන් සිදුකළ සුළු මුදල් ගෙවීම පහත දැක්වේ.

| විස්තරය | වටිනාකම රු. |
|---|---|
| ලිපිද්‍රව්‍ය | 250 |
| පිරිසිදු කිරීමේ වියදම් | 600 |
| සංග්‍රහ වියදම් | 400 |
| ගමන් වියදම් | 350 |
| **එකතුව** | **1 600** |






Copyright © www.e-thaksalawa.moe.gov.lk

මේ අනුව වියදම් කළ මුදල රු. 1 600 කි. සුළු මුදල් භාරකරු නැවත මුදල් ඉල්ලා සිටින විට ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට ලබා දෙන්නේ වියදම් කළ මුදල වූ රු. 1 600 ක් පමණි. එය සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීමකි.

එවිට

| | රු. |
|---|---|
| අත ඉතිරි මුදල් ශේෂය | 400 |
| සුළු මුදල් ප්‍රතිපූරණය | 1 600 |
| සුළු මුදල් අග්‍රිමය | 2 000 |

සුළු මුදල් ගෙවීම් ප්‍රතිපූරණය කර ගැනීම සඳහා සුළු මුදල් භාරකරු විසින් ඒ දක්වා සිදුකරන ලද සුළු මුදල් ගෙවීම්වලට අදාළ වවුචර් සහිතව ගෙවීම් වවුචරයක්, ප්‍රධාන මුදල් භාරකරු වෙත ලබා දිය යුතුය.


**අභ්‍යාස අංක 01 :-**

සීමිත ප්‍රභා සමාගම සුළු මුදල් වියදම් ගෙවීම් සඳහා අග්‍රිම ක්‍රමයට සුළු මුදල් ගෙවීම් ජර්නලයක් පවත්වාගෙන යයි. එම ව්‍යාපාරයේ සුළු මුදල් ගනුදෙනු සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

2020.01.31 වන විට සුළු මුදල් භාරකරු අත ඉතිරි ව තිබූ මුදල රු. 330 ක් විය. ජනවාරි මාසයේ සුළු වියදම් සඳහා රු. 1 670 ක් වැය වූ බව සුළු මුදල් වවුචරයේ සටහන් ව තිබුණි.

ඉහත තොරතුරු ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම කොපමණද ?
2. 2020.02.01 දින ප්‍රධාන මුදල් භාරකරු විසින් ප්‍රතිපූරණය කළ මුදල කොපමණද ?
3. 2020.02.01 දින සුළු මුදල් අග්‍රිමය රු. 500 කින් වැඩි කිරීමට තීරණය කළේ නම් ප්‍රතිපූරණය කළ මුදල කොපමණද ?
4. 202.03.01 දින රු. 729 ක සුළු මුදල් ශේෂයක් ඉතිරි වුයේ නම්, එදිනට ප්‍රතිපූරණය කළ යුතු මුදල කොපමණද ?





Copyright© www.e-thaksalawa.moe.gov.lk

# ගිණුම්කරණය

## සුළු මුදල් ගෙවීම් ජර්නලය පිළියෙළ කිරීම

සුළු මුදල් ගෙවීම් ලෙජරයට පිටපත් කිරීම පහසු කිරීම සඳහා ඒ ඒ ගෙවීම් වර්ගය වෙනුවෙන් වෙන වෙනම විශ්ලේෂණ තීරු සහිතව සුළු මුදල් ගෙවීම් ජර්නලය පවත්වාගෙන යනු ලැබේ.

නිදසුන් :-

ඒ අනුව මුද්දර ගාස්තු, ලිපි ලියාපදිංචි ගාස්තු, ලියුම් කවර මිලට ගැනීම, යනාදී සමාන වර්ගයේ වියදම් හඳුනාගෙන ඒවා “තැපැල් වියදම්” නමින් වූ විශ්ලේෂණ තීරුවකට ඇතුළත් කිරීම

එසේ විශේෂිත වූ විශ්ලේෂණ තීරුවක ඇතුළත් කළ නොහැකි විවිධ වර්ගයේ සුළු වටිනාකම්වලින් යුත් ගෙවීම් සඳහා “විවිධ” යන නමින් වූ විශ්ලේෂණ තීරුවකට ඇතුළත් කිරීම.

විශ්ලේෂණ තීරුවකට ඇතුළත් කිරීමට නොහැකි නමුත් වෙන වෙනම අදාළ ගිණුමකට පිටපත් කළ යුතු අගයන් “ලෙජර් ගිණුම” යන නමින් වූ විශ්ලේෂණ තීරුවකට ඇතුළත් කිරීම

නිදසුන් :-

ණයහිමියන්ට ගෙවීම්
ගෙන ඒමේ වියදම්



## සුළු මුදල් ගෙවීම් ජ'නලය

ව්‍යාපාරයක සුළු මුදල් ගෙවීම් සටහන් කිරීම සඳහා සුළු මුදල් ගෙවීම් ජ'නලයක් පිළියෙල කරනු ලබයි. එහිදී සුළු මුදල් ගනුදෙනු සටහන් කිරීම සඳහා පොදු ලේජරයේ වෙනම ම සුළු මුදල් පාලන ගිණුමක් පිළියෙල කරනු ලබයි. මෙහි විශේෂත්වය වන්නේ සුළු මුදල් ගෙවීම් ජ'නලය මූලික පොතක් ලෙස පමණක් කටයුතු කිරීමයි.

<u>සුළු මුදල් ගෙවීම් ජ'නලය</u>

| දිනය | විස්තරය | වවුචර් අංකය | ගෙවීම් | විශ්ලේෂණ තීරු | | | | ලෙජර් ගිණුම | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | තැපැල් | ලිපිද්‍රව්‍ය | ගමන් | විවිධ | | |
| | | | | | | | | | |

අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත
පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සුළු මුදල් සටහන් තැබීම පිලිබඳ ද්විත්ව සටහන්

සුළු මුදල් අග්‍රිමය ලැබෙන විට හා ප්‍රතිපූරණය කරන විට

සුළු මුදල් පාලන ගිණුම හර
මුදල් පාලන ගිණුම බැර

සුළු මුදල් ගෙවීම් ජර්නලයේ සටහන් කර ඇති ගෙවීම්, අදාළ ගිණුම් වලට සටහන් කළ යුතුය. මෙහිදී ඒ ඒ විශ්ලේෂණ තීරුවේ එකතුව අදාළ ගිණුමට පිටපත් කළ යුතුය. ඒ අනුව විශ්ලේෂණ තීරුවල එකතුව

අදාළ ගිණුම හර
සුළු මුදල් පාලන ගිණුම බැර

## සුළු මුදල් ගෙවීම් ජර්නලයක් පවත්වාගෙන යාමේ වාසි

ප්‍රධාන මුදල් ගෙවීම් ජ'නලය විශාල වීම වැළැක්වීම.

වියදම් පාලනයක් සිදු වීම.

ශ්‍රම විභාජනයක් සිදුවීම.

කාලය ඉතිරි වීම.

වැරදි හා වංචා අවම වීම.



අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත
පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ගිණුම්කරණය

**සුළු මුදල් සටහන් තැබීම පිළිබඳ ද්විත්ව සටහන්**

සුළු මුදල් අග්‍රිමය ලැබෙන විට හා ප්‍රතිපූරණය කරන විට

සුළු මුදල් පාලන ගිණුම හර
මුදල් පාලන ගිණුම බැර

සුළු මුදල් ගෙවීම් ජර්නලයේ සටහන් කර ඇති ගෙවීම්, අදාළ ගිණුම් වලට සටහන් කළ යුතුය. මෙහිදී ඒ ඒ විශ්ලේෂණ තීරුවේ එකතුව අදාළ ගිණුමට පිටපත් කළ යුතුය. ඒ අනුව විශ්ලේෂණ තීරුවල එකතුව

අදාළ ගිණුම හර
සුළු මුදල් පාලන ගිණුම බැර

**අභ්‍යාස අංක 02 :-**

B ගේ ව්‍යාපාරයේ අග්‍රීමය රු. 1 000 කි. 2020 ජනවාරි මාසයේ පහත සුළු ගෙවීම් දක්නට ලැබුණි.

1/01 - සුළු මුදල් අග්‍රීමය ලැබුණා.

1/02 - ගමන් ගාස්තු රු. 50 යි.

1/03 - තැපැල් ගාස්තු රු. 75 යි.

1/04 - ලිපි ද්‍රව්‍ය රු. 15 යි.

1/05 - සංග්‍රහ වියදම් රු. 10 යි.

1/06 - පිරිසිදු කිරීමේ වියදම් රු. 25 යි.

1/07 - පෑන් පැන්සල් රු. 40 ක ගත්තා.

1/08 -C ට මුදල් ගෙව්වා රු. 100 යි.

1/09 - බස් ගාස්තු රු. 100 ක් ගෙව්වා.

1/12 - දුම්රිය පාර්සල් ගාස්තු රු. 100 යි.

1/14 - ගෙන ඒමේ වියදම් රු. 100 යි.

1/15 - අග්‍රීමය ප්‍රතිපූරණය කලා




අවශ්‍ය වන්නේ,

1. 2020 ජනවාරි 15 අවසන් කාලය සඳහා සුළු මුදල් ගෙවීම් ජ'නලය පිළියෙල කරන්න.
2. සුළු මුදල් පාලන ගිණුම පිළියෙල කර ලෙජරයට පිටපත් කරන්න.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ගිණුම්කරණය

**අභ්‍යාස අංක 03**

C ගේ ව්‍යාපාරයේ 2020 ජුනි මාසයේ සුළු මුදල් ගනුදෙනු පහත දැක්වේ.

6/01 - දින සුළු මුදල් ශේෂය රු. 20 යි.

6/01 - අග්‍රිමය ප්‍රතිපූරණය කළා. රු. 980 යි.

6/03 - රු. 20 ක බස් ගාස්තු ගෙව්වා.

6/04 - රු. 80 ක තැපැල් ගාස්තු ගෙව්වා.

6/05 - රු. 80 ක තැපැල් ගාස්තු ගෙව්වා.

6/06 - රු. 200 ක් D ට ගෙව්වා.

6/08 - රු. 22 ක ලිපි ද්‍රව්‍ය ගත්තා.

6/10 - රු .80 ක ගෙන ඒමේ වියදම් දැරුවා.

6/13 - ගමන් ගාස්තු රු. 12 ක් ගෙව්වා.

6/15 - එකක් රු. 13 බැගින් පෑන් 3 ක් මිලට ගත්තා.

6/15 - අග්‍රිමය ප්‍රතිපූරණය කළා. එහිදී අග්‍රිමය රු. 2 000 ක් දක්වා වැඩි කළා.

6/16 - ගමන් ගාස්තු රු. 25 යි.

6/18 - පිරිසිදු කිරීමේ වියදම් රු. 25 යි.

6/20 - පරිත්‍යාග රු. 5 යි.

6/21 - සංග්‍රහ වියදම් රු. 80 යි.

6/22 - අකුරු ඇමිණීමේ රිබන් පටි ගත්තා රු. 50 යි.

6/23 - ලිපි ගොනු ඇමිණීමේ කටු ගත්තා රු. 50 යි.

6/24 - රු. 150 ක ගණක යන්ත්‍රයක් ගත්තා.

6/25 - රු. 250 ක් C රැගෙන ගියා.

6/27 - මුද්දර ගත්තා. රු 20 යි.

6/28 - රු 100 ක මුදලක් සුළු මුදල් භාරකරු වංචා කර තිබුණි.

6/30 - අග්‍රිමය ප්‍රතිපූරණය කළා.



අවශ්‍ය වන්නේ,

1. ඉහත ගනුදෙනු සුළු මුදල් ගෙවීම් ජ'නලයක සටහන් කර ලෙජරයට පිටපත් කරන්න

අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත
පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

Copyright © www.e-thaksalawa.moe.gov.lk